# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

# இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசு வர்த்தமானப் பத்திரிகை

# The Gazette of the Democratic Socialist Republic of Sri Lanka

අති විශෙෂ அதிவிசேஷமானது EXTRAORDINARY

අංක 1055/13 – 1998 නොවැම්බර් 26 වැනි බ්‍රහස්පතින්ද – 1998.11.26

*1055 / 13 ஆம் இலக்கம் - 1998 ஆம் ஆண்டு நவெம்பர் மாதம் 26 ஆம் திகதி வியாழக்கிழமை*

No. 1055 / 13 – THURSDAY, NOVEMBER 26, 1998

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.) *(அரசாங்கத்தின் அதிகாரத்துடன் பிரசுரிக்கப்பட்டது)* (Published by Authority)


# I වැනි කොටස : (I) වැනි ඡෙදය — සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

එල්. ඩී. – බී. 4/96.

### 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනත

1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 15(7) සහ 15(8) වගන්තිය සමග කියවිය යුතු එහි 61 වන වගන්තිය යටතේ ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ නියෝග.

මහින්ද රාජපක්ෂ,
ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය.

1998 නොවැම්බර් මස 18 වන දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග 1998 දේශීය ධීවර බෝට්ටු ලියාපදිංචි ගාස්තු (පළාත් අරමුදලට ගෙවිය යුතු ප්‍රතිශතය) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (1) මේ නියෝග යටතේ එක් එක් වර්ෂයක එක් එක් පළාතක පදිංචි යම් තැනැත්තකුට අයිති දේශීය ධීවර බෝට්ටු ලියාපදිංචි කිරීම සඳහා ඒ වර්ෂයේ ජනවාරි මස පළමු වන දින සිට නොවැම්බර් මස තිස් වන දින දක්වා ලැබුණු ගාස්තුවලින් 25%ක් ධීවර අධ්‍යක්ෂවරයා විසින් ඒ ඒ පළාත්වල ධීවර විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා මගින් ඒ ඒ පළාත්වල පළාත් අරමුදලට ඒ වර්ෂයේ දෙසැම්බර් මස පහළොස් වන දිනට පෙර ගෙවිය යුතුය.

(2) එක් එක් වර්ෂයක එක් එක් පළාතක පදිංචි යම් තැනැත්තකුට අයිති දේශීය ධීවර බෝට්ටුවල ලියාපදිංචිය අළුත් කිරීම සඳහා ඒ වර්ෂයේ ජනවාරි මස පළමු වන දින සිට නොවැම්බර් මස තිස් වන දින දක්වා ලැබුණු ගාස්තුවලින් 25%ක් ධීවර අධ්‍යක්ෂවරයා විසින් ඒ ඒ පළාත් වල ධීවර විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා මගින් ඒ ඒ පළාත්වල පළාත් අරමුදලට ඒ වර්ෂයේ දෙසැම්බර් මස පහළොස් වන දින ගෙවිය යුතුය.

1 A – H 1641 – 1,960 (98/11)

(3) ඉහත (1) සහ (2) ඡේදවල සඳහන් පරිදි අදාල වර්ෂයේ දෙසැම්බර් පළමු වන දින සිට දෙසැම්බර් තිස් එක් වන දින දක්වා ලියාපදිංචි කිරීම සහ ලියාපදිංචිය අලුත් කිරීම සඳහා ලැබුණු ගාස්තුවලින් 25%ක් ඊළඟ වර්ෂයේ ජනවාරි මස පහළොස් වන දිනට පෙර ධීවර අධ්‍යක්ෂවරයා විසින් ඒ ඒ පළාත්වල ධීවර විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා මගින් ඒ ඒ පළාත්වල පළාත් අරමුදලට ගෙවිය යුතුය.

3. ඉහත 2 වන නියෝගය යටතේ, එක් එක් වර්ෂයක එක් එක් පළාතක සිටින තැනැත්තන්ට අයත්, ඒ ඒ පළාත්වල ලියාපදිංචි කරන ලද ධීවර බෝට්ටු පිළිබඳ විස්තරයක් ධීවර අධ්‍යක්ෂවරයා විසින් ඒ ඒ පළාත්වල ධීවර විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයාට මෙහි උපලේඛනයේ දක්වා ඇති නිශ්චිත ආකෘති පත්‍රය අනුව ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතුය.

3 වන නියෝගය.

## උපලේඛනය

..............................දින සිට ......................දින දක්වා කාලසීමාව සඳහා ලියාපදිංචි
ධීවර බෝට්ටු හා ඒ සඳහා අයකරනු ලබන ගාස්තු පිළිබඳ විස්තරය

| 2.1 | දිස්ත්‍රික්කය | යාත්‍රා වර්ගය | ලියාපදිංචි කළ සංඛ්‍යාව | ලැබුණු ලි.ස. ගාස්තු රු. | 75% රු. | 25% රු. | ලියාපදිංචිය අළුත් කරන ලද යාත්‍රා සංඛ්‍යාව | ලියාපදිංචි අළුත් කිරීමේ ගාස්තු | 75% රු. | 25% රු. |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2.1.1 | | අඩි 32ට වැඩි (ඇ.ස.එ.)* | | | | | | | | |
| 2.1.2 | | අඩි 32 දක්වා (ඇ.ස.එ.)* | | | | | | | | |
| 2.1.3 | | අඩි 17 1/2 සිට අඩි 23 දක්වා (පි.ස.එ.)† | | | | | | | | |
| 2.1.4 | | පාරම්පරික (යාන්ත්‍රික) (පි.ස.එ.)† | | | | | | | | |
| 2.1.5 | | පාරම්පරික (යාන්ත්‍රික නොවන) | | | | | | | | |

03. ඉහත විස්තරවලින් දැක්වෙන ධීවර බෝට්ටු ලියාපදිංචිය වෙනුවෙන් උක්ත කාලපරිච්ඡේදය තුළ ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුව අයකළ ගාස්තුවලින් 25%ක් වන රුපියල්.....................ක මුදලක් ලංකා බැංකුවේ අංක................ හා දිනැති චෙක්පතින් මේ සමඟ එවමි.

04. ඉහත චෙක්පත හා මේ ලිපිය ලද බව ඒවා ලැබුණු දින සිට දින 7ක් ඇතුළත කරුණාකර දන්වන්න.

......................

අධ්‍යක්ෂ,
ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව.

දිනය : ........................

* ඇ.ස.එ.–ඇතුළත සවි එන්ජින්.
† පි.ස.එ.–පිටත සවි එන්ජින්.